## සංක්ෂිප්තය

මෙම පර්යේෂණ නිබන්ධනය වර්තමාන පාසල් වල අභ්‍යන්තර අධීක්ෂණය සිදුවන ආකාරය විමසා බැලීම සඳහා වූ අධ්‍යයනයකි.

මෙහිදී වර්තමානයේ පාසල් අභ්‍යන්තර අධීක්ෂණය ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න විමසා බැලීම අභ්‍යන්තර අධීක්ෂණය පාසල් පරිපාලකයන් හා ගුරුවරුන් සංජානනය කරන ආකාරය විමසීම, පාසල් අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලියේ ප්‍රබලතා හා දුබලතා විමර්ශනය කිරීමත් පාසල් අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලියට පවතින බාධාකාරී සාධක විමසීමත් පාසල් අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට ප්‍රතිචාර දෙන්නන්ගේ අදහස් හා යෝජනා විමසා බැලීමත් යන සුවිශේෂී අරමුණු මත පිහිටා අදාල අධ්‍යයනය සිදුකරන ලදී.

මෙහි පළමු පරිච්ඡේදයේ දී, අධ්‍යයන ගැටලුවත්, එහි පසුබිමත්, අධ්‍යයනයේ අරමුණු, අධ්‍යයන ක්‍රම පිළිවෙත, නියැදිය, පද නිර්වචනය, පර්යේෂණ සැලැස්ම හා අධ්‍යයනයේ වැදගත්කම ඇතුළුව මාතෘකාව පිළිබඳ පුළුල් හැඳින්වීමක් කර ඇත. දෙවන පරිච්ඡේදය යටතේ පර්යේෂණ මාතෘකාවට අදාළ න්‍යායාත්මක තොරතුරු හා දේශීය විදේශීය පර්යේෂණ තොරතුරු අනාවරණ පිළිබඳ සාහිත්‍ය විමර්ශනයක යෙදෙන ලදී.

තෙවන පරිච්ඡේදයෙන් පර්යේෂණ ක්‍රම ශිල්ප, ප්‍රශ්නාවලිය සකස් කරන ආකාරය, නියාමක පරීක්ෂණ නියැදිය තෝරා ගැනීම, නියැදියට ප්‍රශ්නාවලිය ලබාදීම ඇතුළු දත්ත ලබා ගැනීමේ ක්‍රම ශිල්ප වල විස්තරයක් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, ලිපි ලේඛන පරිශීලනය මගින් ලබාගත් දත්ත ඉදිරිපත් කිරීම, විශ්ලේෂණය හා අර්ථකථනය කිරීම හතරවන පරිච්ඡේදයේදී සිදුකරන ලද අතර ඒ මගින් එළඹිය හැකි නිගමන හා යෝජනා පස්වන පරිච්ඡේදයේ ඉදිරිපත් කරන ලදී.

මෙම අධ්‍යයනය මගින් ගොඩනඟාගත් අරමුණුවලට අනුව නිගමනවලට එළඹී ඇත. එම පර්යේෂණ අනාවාරණ හා නිගමන සැලකීමේ දී අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනයටත් ගුරුවරුන්ගේ වෘත්තීමය සංවර්ධනයටත් හේතු වන බව පෙන්වා දෙන ලදී. නමුත් සැලසුම් කළ අඛණ්ඩව ක්‍රියාත්මක වන නවීකරණයන්ට යොමු වූ අධීක්ෂණ ක්‍රමයක් තවමත් ක්‍රියාත්මක නොවන බව අනාවාරණය විය.

අධීක්ෂණ ක්‍රියාවලිය ගුරුවරු හා අධීක්ෂකයන් විසින් සංවර්ධනය කරන ආකාරයට අධීක්ෂණය ගුරුවරුයාගේ ස්වාධීනවත්‍ය පෞද්ගලිකත්වයට ගරු කළ යුතු බව පිළිගෙන තිබුණි. අධීක්ෂකවරු ඒ පිළිබඳ ව වැඩි සැලකිල්ලක් දක්වා නොතිබිණි. අධීක්ෂණයේ දී ගැටලු මතුවූ විට ගුරුවරයාගේ අදහස් සැලකිල්ලට ගෙන ඉදිරිය සැලසුම් කළ යුතු බව පිළිගෙන තිබුණි.

අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය තුළ ප්‍රබලතා හා දුබලතා කිහිපයක් දක්නට ලැබුණි. එහිදී ප්‍රබලතා ලෙස අධීක්ෂණ වාර්තා ගොනු කර තබා ගන්නා බවත්, අඩුපාඩු දුටුවිට විවේචනය නොකරන බවත් පෙන්වා දී තිබුණි. නමුත් දුබලතා කිහිපයක්ද දක්නට ලැබිණි. අධීක්ෂණය නීතිමය අවශ්‍යතාවය මත සිදුකිරීමෙන් අධීක්ෂණය සඳහා මුළු කාලච්ඡේදයේම රැඳී

නොසිටීමත්, අඩුපාඩු හඳුනාගෙන නිවැරදි කිරීමක් සිදුනොවීමත් ගුරුවරුන්ගෙන් වැඩ ගැනීමට ඇති ආයුධයක් ලෙස අධීක්ෂණය යොදා ගන්නා බවත් හෙළි විය.

අධීක්ෂණය ක්‍රියාත්මක කිරීමේ දී බලපාන බාධාකාරී සාධක කිහිපයක් හඳුනාගන්නා ලදි. අධීක්ෂකයන්ගේ ජ්‍යෙෂ්ඨත්වය හා ස්ත්‍රී/පුරුෂ භාවත්, අධීක්ෂණයට ලබා ඇති පුහුණුව ප්‍රමාණවත් නොවන බවත් පාසල් වල පවතින සම්පත් වල අඩු බව අධීක්ෂණයේ යෙදෙන පුද්ගලයන් නිලබලවාදි ක්‍රම අනුගමනය කිරීම වැනි කරුණු හෙළි විය.

අධීක්ෂණ ක්‍රියාවලිය ඉදිරියට සාර්ථක කර ගැනීම සඳහා අධීක්ෂකයන් හා අධීක්ෂණයට ලක්වන්නන් විසින් ඉදිරියේදි අභ්‍යන්තර අධීක්ෂණය ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳ ව කළ යෝජනා හා පිළියම් කිහිපයක් අනාවරණය විය. අධීක්ෂණ මණ්ඩලයට හොඳ පුහුණුවක් අවශ්‍ය බවත්, අධීක්ෂකයා හා ගුරුවරයා අතර හොඳ සම්බන්ධයක් තිබිය යුතු බවත් ස්වයං අධීක්ෂණය සායනික අධීක්ෂණය වැනි ක්‍රම ක්‍රියාත්මක කළ යුතු බවත් අනාවරණය විය.

පර්යේෂණය තුළින් කරගන්නා ලද අනාවරණ තුළින් නිගමන වලට එළඹී අතර ඒ අනුව අධ්‍යයනයේ යෝජනා, වැඩිදුර පර්යේෂණ සඳහා ඉඟි ඉදිරිපත් කර පර්යේෂණ නිබන්ධනය නිමාවට පත් කර ඇත.